

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය
நிருவாக மேன்முறையீடுகள் நியாயசபை
Administrative Appeals Tribunal

කාර්ය සාධන වාර්තාව

செயலாற்றுகை அறிக்கை

Performance Report

2021

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

2020 කාර්ය සාධන වාර්තාව

පටුන	පිටුව
1.1 හැඳින්වීම	1
1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර අරමුණු	1
1.3 ප්‍රධාන කාර්යයන්	
1.4 සංවිධාන සටහන	2
02. ප්‍රගතිය හා ඉදිරි දැක්ම	3
03. 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වන මූල්‍ය කාර්ය සාධනය	4
3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	6
3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	7
3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	8
3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය	8
3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	8
3.9 විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද ආවරණ ලිපිය	9
විගණකාධිපතිගේ වාර්ෂික විගණන වාර්තාව	10
06. මානව සම්පත් පැතිකඩ	15
6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය	15
6.3 මානව සම්පත් සංවර්ධන	15
07. අනුකූලතා වාර්තාව	16

2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ආයතනයේ නම: පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

වැය ශීර්ෂ අංක 09

1.1 **හැඳින්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 59 (1) ඡේදය යටතේ වූ 2002 අංක 4 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානයන් ප්‍රකාර පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පිහිටුවා ඇත.

1.2 **ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු**

1.2.1. දැක්ම

සේවා දායකයන්ගේ වෘත්තීයමය ගැටලුවලට පරිපාලනමය රෙගුලාසිවලට අනුව සාධාරණ ව විසඳුම් ලබා දීම.

1.2.2. මෙහෙවර

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ix වැනි පරිච්ඡේදයෙන් පවරා ඇති බලතල ක්‍රියාත්මක කරමින් රාජ්‍ය නිලධාරියෙකු හෝ පොලිස් නිලධාරියෙකු සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණයක් හෝ නියමයක් පිළිබඳව ගුණාත්මක සහ ස්වාධීන සමාලෝචනයක් සිදුකර පරිපාලනමය සාධාරණත්වය ඉටු කර දීම.

1.3 **ප්‍රධාන කාර්යයන්**

1.3.1 රාජ්‍ය නිලධාරීන් සහ පොලිස් නිලධාරීන් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් දෙනු ලබන තීරණයන්ට සහ නියමයන්ට එරෙහිව ගොනු කරනු ලබන අභියාචන විමර්ශනය කර විනිශ්චයන් ලබාදීම

1.3.2. අභියාචන භාර ගැනීම

2002 අංක 4 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ 4 (1) සහ 4(2) අනුව ඉදිරිපත් කළ යුතු ය.

1.3.3 අභියාචනයක් ලද පසු ගන්නා පියවර

එකී පනතේ 5(1) සහ 5(2) ක්‍රියාපරිපාටිය මූලික පියවර ගෙන 6(අ), (ආ), (ඇ), (ඈ) අනුව ක්‍රියා කිරීම

1.3.4 අදාල පනතේ 7 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අභියාචනය ලැබී මාස 2 ක් ඇතුළත අවසන් වශයෙන් සුදුස්සක් කළ යුතු ය.

1.3.5 අදාල පනතේ 8(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව නඩු විභාගය සිදු කරනු ලබන අතර 8(2) වගන්තියට අනුව එකී තීරණයක් අවසානාත්මක හා තීරණාත්මක වන අතර එය අධිකරණයක යම් නඩුවකදී හෝ නඩු කටයුත්තකදී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

1.4 **සංවිධාන සටහන**



පනතේ 2 වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සභාපතිතුමා ඇතුළු තිදෙනෙකුගෙන් සමන්විත විනිශ්චය මණ්ඩලයක් පත් කරනු ලැබේ.

2021.12.31 දිනට සංයුතිය:

සභාපති විනිසුරු එන්.ඊ.දිසානායක මහතා
සාමාජික ජනාධිපති නීතිඥ ඒ.ඥාණදාසන් මහතා
සාමාජික ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාමික ජී.පී.අබේකීර්ති මහතා

ලේකම් කේ.බී.ඩි.එම්.පී.බී.දිසානායක මහතා
සහකාර ලේකම් එම්.රෆීක් ඉස්මායිල් මහතා

02. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

I. අභියාචන සම්බන්ධ ප්‍රගතිය - 2021.12.31 දිනට

2021.01.01 දිනට ඉදිරියට ගෙන ආ අභියාචන සංඛ්‍යාව		924
නැවත කැඳවූ අභියාචන සංඛ්‍යාව	11	
2021 වර්ෂය තුළ ලද අභියාචන සංඛ්‍යාව	167	178
කාලසීමාව තුළ විභාග කිරීමට තිබූ මුළු අභියාචන සංඛ්‍යාව		1,102
කාලසීමාව තුළ ඉල්ලීමට ඉඩදුන් අභියාචන සංඛ්‍යාව (අනුමත)	14	
කාලසීමාව තුළ ඉල්ලා අස්කරගත් අභියාචන සංඛ්‍යාව	24	
නිෂ්ප්‍රභ කළ අභියාචන සංඛ්‍යාව	41	
අභියාචකගේ / රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ/ ජාතික පොලිස් කොමිෂන් සභාවේ ඉල්ලීම මත බහා තබන ලද අභියාචන සංඛ්‍යාව	08	
ඒ අනුව මෙම කාලසීමාව තුළ අවසන් කළ අභියාචන සංඛ්‍යාව		87
2021.12.31 දිනට අවසන් නොවූ 2022 වර්ෂයට ගෙන ගිය අභියාචන සංඛ්‍යාව		1,015

II. ඉදිරි දැක්ම

රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා පොලිස් කොමිෂන් සභාව හරහා ඉදිරිපත් කෙරෙන අභියාචන පිළිබඳව මේ වන විටත් ආරම්භකොට පවත්වාගෙන යනු ලබන කටයුතු නොපිරිහෙළා, නොවලහා යථාවත් කිරීම හා තවදුරටත් ඉදිරිපත් කෙරෙන අභියාචන සම්බන්ධයෙන් තත්ත්වාකාරයෙන් කටයුතු කිරීම.

03 පරිච්ඡේදය - 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021		සටහන	නාත්‍ය 2021	නැවත ගලපන ලද 2020	
රු.			රු.	රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
	ආදායම් නොවන ලැබීම්				
-	භාණ්ඩාගාර අග්‍රිම		28,910,000	27,840,000	ඒසීඒ-3
-	තැන්පතු				ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		717,880	458,900	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්				
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**29,627,880**	28,298,900	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**29,627,880**	28,298,900	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		19,200	4,785	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		29,608,680	28,294,115	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
20,050,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	16,027,986	16,000,955	
14,260,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	12,498,338	12,545,441	ඒසීඒ-2
	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7			
	පොළී ගෙවීම්	8			
	වෙනත් පුනරාවර්තන වියදම්	9			
34,310,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**28,526,324**	28,546,396	
	මූලධන වියදම්				
120,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	-	-	
100,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	70,930	43,072	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසීඒ-2
	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
50,000	හැකියා වර්ධනය	14	-	-	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
270,000	**මුළු මූලධන වියදම් (උ)**		**70,930**	43,072	
	තැන්පතු ගෙවීම්		-	-	ඒසීඒ-4

	අන්තිකාරම් ගෙවීම්	1,262,000	120,000	ඒඕසී-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්	-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (උඟ)	1,262,000	120,000	
	මුළු වියදම් එ = (ඊ+උ+උඟ)	29,859,254	28,709,468	
34,580,000	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**	(250,574)	(415,353)	
	අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය	(250,574)	(415,353)	ඒඕසී-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය	19,200	4,785	ඒඕසී-3
		-	-	

ඒසීඒ-පී

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2021 රු.	2020 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	20,522,090	20,478,200
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	1,622,900	1,078,780
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**22,144,990**	**21,556,980**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		1,622,900	1,078,780
දේපළ පිරියත හා උපකරණ සංචිතය		20,522,090	20,478,200
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	-	-
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**22,144,990**	**21,556,980**

පිටු අංක 07 සිට 29 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 30 සිට 31 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී	ගණන්දීමේ නිලධාරී	ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	
දිනය : 2022.02.24	දිනය : 2022.02.24	දිනය : 2022.02.24

කේ.බී.ඩී.එම්.ඩී.බී. දිසානායක
ලේකම්
පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

එම්. රජීක් ඉස්මාගිල්
සහකාර ලේකම්
පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

පිළිගත් ලේඛාධිකරණ විගිසුරු අතිල් ගුණරත්න
සභාපති
පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

3.3 මූදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තක්‍ෂ	නැවත ගලපන ලද
	2021 රු.	2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	384,474	411,953
අග්‍රිම ලැබීම්	28,910,000	27,840,000
අත්තිකාරම් අයකර ගැනීම්	583,980	458,900
තැන්පතු ලැබීම්	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**29,878,454**	**28,710,853**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	28,526,324	28,542,996
සහනාධාර සහ මාරුකිරීම්	-	-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	-	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	19,200	4,785
අත්තිකාරම් ගෙවීම්	1,262,000	120,000
තැන්පතු ගෙවීම්	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**29,807,524**	**28,667,781**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (අෑ)=(අ)-(ආ)	**70,930**	**43,072**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	70,930	43,072
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**70,930**	**43,072**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(70,930)**	**(43,072)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(අෑ) + (ඊ)	0	0
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් නැත

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය රු.	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
20.3.9900	වෙනත් ආදායම්	ඇස්තමේන්තු කළ නොහැක.	-	72,220/-	-

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන ප්‍රාග්ධන	34,310,000 270,000	34,310,000 270,000	28,526,324 70,930	83% 26%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන - **නැත.**

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	2021.12.31 දිනට භාණ්ඩ සම්ක්ෂණ වාර්තාව අනුව ශේෂය	2021.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය% ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	-	-	-
9152	යන්ත්‍රෝපකරණ	-	20,522,090	-	-
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරිගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. PIC/B/AAT/2/21/31 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2022 ජූනි 28 දින

0230
07 JUL 2022

සභාපති,

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව

යටෝක්ත විගණන වාර්තාව මේ සමඟ එවා ඇත.

02. ජාතික විගණන පනතේ 39(1) උප වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කර මෙම වාර්තාවේ දින සිට මාස 03 ක් ඇතුළත යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හෝ සැලැකිල්ලට ගත් ක්‍රියාමාර්ග පිළිබඳව මා වෙතද, භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත හා අදාළ අමාත්‍යවරයාට දැනුම් දිය යුතුය.

03. පනතේ 39(2) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාවේ ඇතුළත් මා විසින් පෙන්වා දී ඇති යම් ක්‍රියාමාර්ගයක් හෝ කරුණක් පිළිබඳව ක්‍රියාත්මක කිරීමේ හෝ නොහැකිවීමේ හේතු නිබෙනම් ඒ බවද මා වෙත දන්වා එවන මෙන් කාරුණිකව දන්වමි.

එම්.සෝමතිලක
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත:- 1. මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා.
2. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය.

09

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. PIC/B/AAT/2/21/31 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2022 ජූනි 29 දින

සභාපති,

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව වූ මෙම වාර්තාව නිකුත් කරනු ලබන අතර ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් ජාතික විගණන පනතේ 39 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කර මෙම වාර්තාවේ දින සිට මාස 03 ක් ඇතුළත යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හෝ සැලකිල්ලට ගත් ක්‍රියාමාර්ග පිළිබඳව මා වෙත වාර්තා කළ යුතුය. මෙම වාර්තාවේ පෙන්වා දී ඇති යම් ක්‍රියාමාර්ගයක් හෝ කරුණක් පිළිබඳව ක්‍රියාත්මක කිරීමේ හෝ නොහැකිවීමේ හේතු තිබේ නම් ඒ බව ද මා වෙත දන්වා එවිය යුතුය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
අධිකාරියේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.19,200 ක්වූ අග්‍රිම ශේෂය භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂයක් නොතිබුණද අධිකාරය විසින් විගණනයට ඉදිරිපත් කළ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ 2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය රු.19,200 දක්වා තිබුණි.	මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ 2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය නිවැරදිව සටහන් කළ යුතු වේ.	2021 දෙසැම්බර් 31 දිනට වූ අග්‍රිම ශේෂය රු.19,200 නිවැරදිව භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන ලදී. එම අග්‍රිම ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ නොපෙන්වන ලද්දේ ගිණුම් තුලනය සඳහා එය අවශ්‍ය වූ බැවිනි. මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පිළියෙල කිරීම සිදු කරන ලද්දේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ගිණුම් නිලධාරීන් සඳහා පවත්වන ලද වැඩමුළුවේදී දෙන ලද උපදෙස් පරිදි බව වැඩිදුරටත් දන්වනු කැමැත්තෙමි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු පිළියෙල නොකිරීම හා කොවිඩ් වසංගත තත්ත්වය නිසා වියදම් අවම වීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන් 03 ක සියයට 77 සිට සියයට 100 දක්වා ඉතිරිවීම් පැවතුනි. මූලධන වැය විෂයයන් 02 ක එකතුව රු.170,000 ක්වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.	මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ.	වියදම් ඇස්තමේන්තු පිළියෙල කරන ලද්දේ සාමාන්‍ය තත්ත්වයන් යටතේ දැරීමට සිදුවන වියදම් පුරෝකථනය කිරීමෙනි. 2021 වර්ෂයේ රටේ පැවති අවිනිශ්චිත වාතාවරණය සහ කාර්ය මණ්ඩල හිහය අනුව ඇස්තමේන්තුගත වියදම් දැරීමක් සිදු නොවිය.

2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	නිරීක්ෂණය වටිනාකම රු.	අනුකූල නොවීම	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16.2 වගන්තිය		සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කළ කාර්යසාධන වාර්තාවේ කෙටුම්පත මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	විගණන පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ.	අවසන් විගණන වාර්තාව මෙම විනිශ්චය අධිකාරය වෙත ලැබීමෙන් පසු අපේක්ෂිත

				කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි 138(6)	කොමිෂන් සභාවේ ඇතැම් ගෙවීම් වවුචර්වල අදාල ගොනු පිළිබඳ යොමු සටහන් දක්වා නොතිබුණි.	ගෙවීම් වවුචර්වල අදාල ගොනු පිළිබඳ යොමු සටහන් දැක්විය යුතු වේ.	කාර්ය මණ්ඩල නිහය හා කාර්ය බහුලත්වය මත ඇතැම් වවුචර්වල පමණක් ගොනු අංක සටහන් කිරීම අතපසු වී තිබුණි. එය මෙම වර්ෂයේදී මහහරවා ගන්නා ලෙස අදාල නිලධාරීන් දැනුවත් කර ඇත.
(ඇ)	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	අධිකාරය විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කළ යුතු වේ.	සීමිත කාර්ය මණ්ඩලය හා කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා 2021 වර්ෂය තුලදී මානව සම්පත් සංවර්ධන සැලැස්මක්

			ක්‍රියාවට නැංවීම දුෂ්කර විය. එසේ වුවද 2022 වර්ෂයේ මානව සම්පත් සංවර්ධන සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.
(ඇ)	2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය	අධිකාරය විසින් 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ දින 23 ක් ප්‍රමාද වී එනම් 2022 මාර්තු 23 දිනදීය.	මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා පෙබරවාරි 28 දිනට පෙර ඉදිරිපත්කළ යුතු වේ.	මෙම විනිශ්චය අධිකාරයෙහි සභාපති වශයෙන් මා පත් කරන ලද්දේ 2022 ජනවාරි 01 දින සිට වන අතර 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ අඩංගු කරුණු සහතික කිරීම සඳහා ඒවා පිළිබඳ සැහීමකට පත්විය යුතු බැවින් මගේ අත්සනින් ඉදිරිපත් කිරීමට අතිරේක

කාලයක් අවශ්‍ය විය.ඒ අනුව එම වාර්තා මගේ අත්සනින් යුතුව 2022 මාර්තු 22 දින ඔබ වෙත ඉදිරිපත් කරන ලදී.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 සැලසුම් කිරීම

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
2020 අගෝස්තු 28 දිනැති 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව රජයේ සියළුම ආයතන විසින් සෑම වර්ෂයක් සඳහාම අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වුවත් අධිකාරය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොනිබුණි.	සෑම වර්ෂයක් සඳහාම අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වේ.	2021 වර්ෂයේ පැවති වසංගත තත්ත්වය තුල ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීමේ දුෂ්කරතා පැවතිණ. 2022 සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කරමින් පවතී.

3.2 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ) 2002 අංක 04 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ 7 වන වගන්තිය ප්‍රකාරව අධිකාරය වෙත ඉදිරිපත් කරන යම් අභියාචනයක් එය ලැබුණු දින සිට මාස 02 ක් ඇතුළත විභාග කර යම් සුදුස්සක් කළ යුතු බව සඳහන් වේ. එසේ වුවද, අධිකාරය වෙත අභියාචනයක් ලැබී මාස 02 ක් ඇතුළත විභාග කර අවසන් කිරීමක් විගණනයේදී නිරීක්ෂණය නොවූ අතර පනතේ එම වගන්තිය මේ දක්වා සංශෝධනය කර නොතිබුණි.	පනතේ 7 වන වගන්තිය ප්‍රකාරව අධිකාරය වෙත ඉදිරිපත් කරන යම් අභියාචනයක් එය ලැබුණු දින සිට මාස 02 ක් ඇතුළත විභාග කර යම් සුදුස්සක් කළ යුතු වේ. එසේ නොමැති නම් පනතේ එම වගන්තිය සංශෝධනය කිරීම සඳහා කටයුතු කළ යුතු වේ.	ඉදිරිපත් වන අභියාචනයක් පිළිබඳව කටයුතු කිරීමේදී මාස 02 ක් ඇතුළත විභාග කර අවසන් කිරීමට නියමිත වුවත් අනපේක්ෂිතව පැන නහින කරුණු හා අභියාචන විශාල සංඛ්‍යාව මත මාස 02 ක් ඇතුළත විභාග කර තීරණ ලබාදීම ප්‍රායෝගික නොවේ. අභියාචන විභාග කිරීමේදී සහ තීරණ ලබාදීමේදී ත්‍රිපුද්ගල විනිශ්චය මණ්ඩලයේ සක්‍රිය සහභාගිත්වය අනිවාර්ය වේ. අධිකාරයේ පනතේ 7 වන වගන්තිය ප්‍රකාරව අභියාචනයක් ලැබුණු දින සිට මාස 02 ක් ඇතුළත විභාග කර අවසන් කිරීම පිළිබඳ ඇති වගන්තිය සංශෝධනය කිරීමේ අවශ්‍යතාවයක් නොපෙනේ.

(ආ)	සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට කටයුතු කිරීමට පැවති අභියාචන සංඛ්‍යාව 929 ක්වූ අතර අධිකාරිය විසින් එම අභියාචනවල කාල විශ්ලේෂණයක් පිළියෙල කර නොතිබුණි.	කටයුතු කිරීමට පවතින අභියාචනවල කාල විශ්ලේෂණයක් ලබා ගත හැකි වන පරිදි තොරතුරු යාවත්කාලීනව පවත්වාගත යුතු වේ.	කාර්ය මණ්ඩල හිඟය මත මෙවැනි සංඛ්‍යාලේඛණ විශ්ලේෂණයක් සඳහා නිලධාරියකු සපයා දීම ගැටළු පවතී. එසේ වුවද 2022 සඳහා මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

4. යහපාලනය

4.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව මහජනයාගේ අවශ්‍යතාවය හා ආයතනය පිළිබඳ චෝදනා හෝ ප්‍රසංශා පළකිරීමට නිල වෙබ් අඩවියක් ඔගින් පහසුකම් සලසා තිබිය යුතු වුවත් අධිකාරය ඒ අනුව කටයුතු කර නොතිබුණි.	මහජනයාගේ අවශ්‍යතාවය හා ආයතනය පිළිබඳ චෝදනා හෝ ප්‍රසංශා පළකිරීමට නිල වෙබ් අඩවියක් මගින් පහසුකම් සලසා තිබිය යුතු වේ.	මහා භාණ්ඩාගාරයේ ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ලද උපදෙස් අනුව ICTA ආයතනය මඟින් නිල වෙබ් අඩවියක් නිර්මාණය කර ගැනීම සඳහා කටයුතු කරගෙන යමින් පවතී.

5. මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
අධිකාරය විසින් විගණනය වෙත ලබාදුන් තොරතුරු අනුව 2021 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 31 ක් වුවද තත්‍ය කාර්ය මණ්ඩලය 19 ක් වූ හෙයින් කාර්ය මණ්ඩලයේ 12 ක පුරප්පාඩු පැවතුනි.	පුරප්පාඩු පිරවීම ට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වේ.	ඔබේ නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. පුරප්පාඩු සම්පූර්ණ කරගෙන රාජ්‍ය සේවය ඇතුළු සිවිල් සමාජය වෙත උපරිම සේවයක් ලබාදීම් සඳහා මෙම අධිකාරය අදාල ආයතන සමඟ ක්‍රියා කරන බව සඳහන් කරනු කැමැත්තෙමි.

එම්.සෝමතිලක
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක - අදාල නොවේ.

05 පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනාගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න. - අදාල නොවේ.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	02	02	-
තෘතීයික	-	-	-
ද්විතීයක	21	12	09
ප්‍රාථමික	08	05	03
එකතුව	31	19	12

6.2 පවතින සීමිත කාර්ය මණ්ඩලයට පුරප්පාඩු ද ආවරණය වන පරිදි ප්‍රායෝගික වශයෙන් යෝග්‍ය වන ආකාරයට රාජකාරි පවරා ඇති බැවින් අධිකාර කාර්යාලයීය රාජකාරි කටයුතු කෙරෙහි බලපෑමක් සිදු නොවීම.

6.3 මානව සම්පත් සංවර්ධන

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය රු. '000		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම් / ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
*දිවයින පුරා ව්‍යාප්තව ගිය කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් මානව සම්පත් පුහුණු කිරීම් කළ නොහැකිව තිබුණි.						

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

ඇංකය	අදාළ කර ගතයුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තිරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.2	වාර්ෂික මූල්‍ය ප්‍රකාශය	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
2.	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.2	පුද්ගල පඬිනඩි ලේඛන / පුද්ගල පඬිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන තනතුරක් අනුමත කාර්ය මණ්ඩලය තුල නොවේ.	ඒ සඳහා ලිපිකරු නිලධාරියෙකු යොදවා ඇත.
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (සිඟාස්) පිළියෙල කර නියමිත දිනට මහ භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල නොවේ.	බැරකම් නොතිබුණි.	බැරකම් ඇතිවුවහොත් ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කිරීම.
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (ජීඒ එන් 20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරාදීම් පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය අනුව රජයේ පඬිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල නොවේ	ගණකාධිකාරිවරයෙකු ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවේ.	සහකාර ලේකම්වරයා ගේ අධීක්ෂණය යටතේ සිදු කෙරේ.
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	විශාල වශයෙන් මිලදී ගැනීම් සිදු නොවේ.	එවැනි සැලැස්මක් ප්‍රායෝගික නොවීම

4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ.	අභ්‍යන්තර විගණකයෙකු නොමැති නිසා එවැනි සැලසුම් සකස් නොකිරීම	ඉදිරි වර්ෂය සඳහා සැලැස්මක් සකස් කිරීමට අදහස් කරමි.
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (එන්බීබී) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ.		
6.	**අභ්‍යන්තර විගණනය**	අදාල නොවේ.		
7.	**විගණන හා කළමනාකරණ කමිටු**	අදාල නොවේ.		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍ර ලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ.		
8.3	රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍ර ලේඛයේ සඳහන් කාලය තුළ සිදුකෙට තිබීම	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල නොවේ.	ගර්හිත කරන ලද භාණ්ඩ නොවීම	ගර්හිත භාණ්ඩ ඇති වුවහොත් මු.රෙ. 772 අනුව කටයුතු කිරීමට අදහස් කරමි.
9.	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලකදී අපහරණය කර තිබීම	අනුකූල නොවේ.	ගර්හිත වාහන නොවීම	අවශ්‍ය වුවහොත් එසේ කිරීමට අදහස් කිරීම
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන් මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම් නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ.		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ.		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			

10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල නොවේ.	අක්‍රිය බැංකු ගිණුම් නොවීම	අක්‍රිය බැංකු ගිණුම් ඇති නොවීමට කටයුතු කිරීම
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළැඹීම	අනුකූල වේ.		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල වේ.		
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල නොවේ.	කල් ඉකුත් වූ ණය ශේෂ නොවීම	හිඟ ණය ශේෂ වුවහොත් එසේ කටයුතු කිරීම
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල නොවේ	පොදු තැන්පත් ගිණුමක් නොවීම	
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	පොදු තැන්පත් ගිණුමක් නොවීම	
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ.		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල නොවේ.	තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම කරනු නොලැබේ.	එවැනි අවශ්‍යතාවක් වුවහොත් එපරිද කටයුතු කිරීම
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල නොවේ.	තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම කරනු නොලැබේ.	එවැනි අවශ්‍යතාවක් වුවහොත් එපරිදි කටයුතු කිරීම
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		
15	**ආදායම් ගිණුම**	අනුකූල නොවේ.	ආදායම් ගිණුමක් නැත.	
16.	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ.		
16.3	20.09.2017 දිනැති එම්ඵස්ඩී චක්‍ර ලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
17.2	ආයතන පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා /	අනුකූල නොවේ.	වෙබ් අඩවියක් ක්‍රියාත්මක නොවේ.	ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවති.

	චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම			
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ.	පුහුණුවීම් ලබා දී නැත.	
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 5/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍ර ලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්ම කර තිබීම	අනුකූල නොවේ.	අධිකරණමය ක්‍රියාදාමයක් සිදුවන ආයතනයක් බැවින් මෙවැන්නක් ක්‍රියාත්මක කිරීමේ අපහසුතාව	ප්‍රායෝගිකව අත්හදා බැලීමට අදහස් කරමි.
18.2	එම චක්‍ර ලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගැයීම් සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල නොවේ.	අධිකරණමය ක්‍රියාදාමයක් සිදුවන ආයතනයක් බැවින් මෙවැන්නක් ක්‍රියාත්මක කිරීමේ අපහසුතාව	ප්‍රායෝගිකව අත්හදා බැලීමට අදහස් කරමි.
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රා.ප.ච.ක්‍ර ලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ.	සමස්ත කාර්ය මණ්ඩලය 19 දෙනෙකු වන නිසා අධිකරණමය කාර්යය භාරයයට මුල්තැන දී කටයුතු කිරීම	සමස්ථ කාර්ය මණ්ඩල 19 ක් බැවින් ප්‍රායෝගිකව අත්හදා බැලීමට අදහස් කරමි.
19.2	කාර්ය මණ්ඩලයේ සැම සාමාජිකයෙකු සඳහා වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ.	සමස්ත කාර්ය මණ්ඩලය 19 දෙනෙකු වන නිසා අධිකරණමය කාර්යය භාරයයට මුල්තැන දී කටයුතු කිරීම	සමස්ථ කාර්ය මණ්ඩල 19 ක් බැවින් ප්‍රායෝගිකව අත්හදා බැලීමට අදහස් කරමි.
19.3	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ.	සමස්ත කාර්ය මණ්ඩලය 19 දෙනෙකු වන නිසා අධිකරණමය කාර්යය භාරයයට මුල්තැන දී කටයුතු කිරීම	සමස්ථ කාර්ය මණ්ඩල 19 ක් බැවින් ප්‍රායෝගිකව අත්හදා බැලීමට අදහස් කරමි.
19.4	ඉහත චක්‍ර ලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල නොවේ.	සමස්ත කාර්ය මණ්ඩලය 19 දෙනෙකු වන නිසා අධිකරණමය කාර්යය භාරයයට මුල්තැන දී කටයුතු කිරීම	සමස්ථ කාර්ය මණ්ඩල 19 ක් බැවින් ප්‍රායෝගිකව අත්හදා බැලීමට අදහස් කරමි.
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.		